**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

**පිරිවෙන් අධ්‍යාපන අංශය**
**பிரிவெனாக்கள் கல்வி பிரிவு**
**Division of Piriven Education**

4 වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / 4 வது மாடி, இசுருபாய, பத்தரமுல்ல, இலங்கை / 4th Floor,Isurupaya, Battaramulla, Sri Lanka
☎ +9411 278 5141 / +9411 278 4910 / +9411 278 4893 / +9411 278 4461 📠 +9411 278 5617 / +9411 278 4992 info@piriven.gov.lk www.piriven.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: ED/ST/BUD/8/3/2/5/1 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2022.07.22 |

සියලු ම කෘත්‍යාධිකාරී, පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා
බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන කෘත්‍යාධිකාරී / ආයතනාධිපති සිල් මෑණියන් වහන්සේලා වෙත,

## 2022.09.07 දින දක්වා පිරිවෙන් පවත්වාගෙන යාම පිළිබඳ නිවේදනය

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් **2022.07.19** දාතමින් "2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොර ව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම" යන මැයෙන් නිකුත් කර ඇති අංක **ED/09/12/06/05/01-2022- (Sub 1)** දරන ලිපියේ සඳහන් ආකාරයට නැවත පාසල් ආරම්භ කරන දිනය **2022.07.25** දින ලෙස සංශෝධනය කර ඇති අතර, 2022 පාසල් වර්ෂයේ පළමු වාරය **2022.09.07** දින දක්වා දීර්ඝ කොට ඇත.

02. ඒ අනුව දිවයින පුරා පිහිටි සියලු ම පිරිවෙන් හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන ද ඊට සමගාමී ව **2022.09.07** වන දින දක්වා පළමු වාරයේ අධ්‍යයන කටයුතු සිදු කළ යුතු වුව ද මීට ඉහත දී **2022.06.18** හා **2022.07.16** දිනැති ව අප විසින් නිකුත් කරන ලද ලිපිවල සඳහන් උපදෙස් අනුව යමින් මේ වන විටත් බොහෝ පිරිවෙන්වල / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවල පළමු වාරයට අදාළ විෂයවාරික ඉලක්ක සම්පූර්ණ කොට පළමු වාර පරීක්ෂණය ද පවත්වා අවසන් කොට ඇති බව නිරීක්ෂණය වේ.

03. එම නිසා මූලික / මහ පිරිවෙන් හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන පහත උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණික ව දන්වමි. (පිරිවෙන් විද්‍යායතන පාසල් සඳහා නිකුත් කර ඇති උපදෙස් හා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු ය.)

### 3.1 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාම

3.1.1 පළමු වාරයට අදාළ මග හැරී ඇති නියමිත විෂය නිපුණතා / නිපුණතා ඒකකවලට මෙන් ම පළමු වාර පරීක්ෂණය පැවැත්වීමෙන් පසු හඳුනාගත් හා තවදුරටත් සංවර්ධනය කළ යුතු විෂය නිපුණතා / නිපුණතා ඒකකවලට අදාළ ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම විෂයභාර ගුරුවරයා විසින් සිදු කළ යුතු අතර ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම පරිවේණාධිපති හිමියන්ගේ වගකීම වේ.

3.1.2 මීට අමතර ව **ඇමුණුම 01** මගින් ඉදිරිපත් කොට ඇති පරිදි 1-5 ශ්‍රේණිවල දෙවන වාරයට අදාළ ව 2022.09.07 දිනට එක් එක් නිපුණතාවයන් / නිපුණතා ඒකකයන් / පාඩම් ආවරණය කිරීම විෂයානුබද්ධ ව සිදු කළ යුතු ය.

3.1.3 උසස් පෙළ පන්තිවල ඉගැන්වීම් සිදු කෙරෙන පිරිවෙන් / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන මේ වන විට පාසල් සඳහා නිකුත් කර ඇති උපදෙස් හා චක්‍රලේඛ ද අනුගමනය කරමින් පාසල්වලට සමගාමී ව නියමිත විෂය නිපුණතා / නිපුණතා ඒකක සම්පූර්ණ කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතු ය.

3.1.4 2022.07.25 වන සඳුදා දින සිට නැවත දැනුම් දෙන තුරු සතියේ සඳුදා, අඟහරුවාදා හා බ්‍රහස්පතින්දා යන දින තුන සාමාන්‍ය වේලාවන් හි දී පිරිවෙන් / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන පැවැත්විය යුතු අතර, අවශ්‍ය නම් ආචාර්ය මණ්ඩලය සමග සාකච්ඡා කොට පිරිවෙන / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන පවත්වා ගන්නා දින තුන පිළිබඳ තීරණ ගැනීමේ බලය කෘත්‍යාධිකාරී හිමි / සීලමාතාව වෙත පැවරේ. එලෙස පිරිවෙන් නොපැවැත්වෙන දින වල දී සිසුන් ට විහාරස්ථාන / නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලබා දීම හෝ මාර්ගගත (Online) ක්‍රමයට ඉගැන්වීම් සිදු කළ යුතු ය. මීට අමතර ව පිරිවෙන් / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන පැවැත්වෙන දින තුන සඳහා විශේෂ කාලසටහනක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතු ය.

3.1.5 කෙසේ නමුත් බහුතර සිසුන් පිරිසක් නේවාසික ව සිටින හා ගුරුවරුන් / සිසුන් සඳහා ප්‍රවාහන දුෂ්කරතා අවම පිරිවෙන් / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවල කෘත්‍යාධිකාරී / පරිවේණාධිපති හිමිවරුන්ගේ / සීල මාතාවන්ගේ අභිමතය පරිදි සතියේ දින පහ තුළ ම අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් නොමැත.

## 3.2 දෛනික පැමිණීම

3.2.1 සිසුන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පිරිවෙන්වලට / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවලට නියමිත වේලාවට පැමිණීම අනිවාර්ය වුව ද, සාධාරණ හේතු මත සිදුවන නොපැමිණීම හා ප්‍රමාද වී පැමිණීම සම්බන්ධයෙන් ඔවුන්ට අපහසුතාවයක් ඇති නොවන පරිදි කටයුතු කිරීමට වග බලාගත යුතු ය.

## 3.3 උත්සව පැවැත්වීම හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් සිදු කිරීම

3.3.1 අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති උපදෙස්වලට අදාළ ව හා නියමිත විෂය නිපුණතා / නිපුණතා ඒකක ආවරණයට බාධාවක් නොවන පරිදි විෂය සමගාමී හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් සිදු කිරීම කෘත්‍යාධිකාරී / පරිවේණාධිපති හිමිවරුන්ගේ / සීල මාතාවන්ගේ අභිමතය අනුව කටයුතු කිරීම පිණිස බලය පැවරේ.

## 3.4 වෙනත් කරුණු

3.4.1 පවතින ආර්ථික හා සාමාජීය ගැටලු සහගත තත්ත්වය මත විවිධ මානසික හා කායික තත්ත්වයන් යටතේ පසුවන ගිහි / පැවිදි සිසුන් සිටිය හැකි බැවින්, ඔවුන් පිළිබඳ ව අවධානය යොමු කොට යහපත් ඉගෙනුම් පරිසරයක් ඇති කිරීමට සියලු ම කාර්ය මණ්ඩල දැනුවත් කිරීම කෘත්‍යාධිකාරී / පරිවේණාධිපති හිමිවරුන්ගේ / සීල මාතාවන්ගේ වගකීමක් වනු ඇත.

04. ඉහත උපදෙස් අනුව කටයුතු කර 2022 පිරිවෙන් වර්ෂය සඳහා පවතින කාල සීමාව තුළ සිසුන්ගේ ඉගෙනුම් කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යන ලෙස තවදුරටත් කාරුණික ව දන්වා සිටිමි.

වටිනාපහ සෝමානන්ද හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන ලේකම් වෙනුවට

**පිටපත්:**

01. අතිරේක ලේකම් (පාලන / සංවර්ධන) - පිරිවෙන් අධ්‍යාපන අංශය
02. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
03. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
04. සියලු ම අංශ හා පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
05. සියලු ම පිරිවෙන් කොට්ඨාස භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
06. සියලු ම විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන් සහ මහත්වරුන්
07. සියලු ම පිරිවෙන් ගුරු උපදේශක හිමිවරුන් සහ මහත්වරුන්

(01–07: කාරු.දැ.ගැ.පි/ අ.ක.ස)

08. ගොනුවට

# මූලික / මහ පිරිවෙන් 1 -5 ශ්‍රේණි

## 2022.09.07 වන දින විට සම්පූර්ණ කළ යුතු විෂයානුබද්ධ විෂය වාරික ඉලක්ක

### ත්‍රිපිටක ධර්මය

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 01 | 01,02,03,04,05,06,09,10,13,16,22,24,28 | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුනරීක්ෂණය කරවන්න. |
| 02 | 01,02,03,04,05,06,10,15,16,23,24 | |
| 03 | 01,02,04,05,06,07,09,12,16,19,23 | |
| 04 | 01,02,04,05,07,08,10,14,17,20,23,25 | |
| 05 | 01,02,04,05,07,08,09,10,11,15,18,23,26,29 | |

### සිංහල

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 01 | ලබා දී ඇති වාර සටහන අනුව පළමු වාරයට අදාළ සියලු විෂය කොටස් සම්පූර්ණ කිරීම අනිවාර්ය වෙයි. මීට අමතර ව දෙවන වාරයට අදාළ කොටසෙන් අදාළ පෙළ පොත්වල පාඩම් දෙකක් දක්වා ද උගන්වා අවසන් කළ යුතු ය. | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුනරීක්ෂණය කරවන්න. |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

### පාලි

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වනපොත් කිරීම හා වාචෝද්ගත |
|---|---|---|
| 01 | කච්චිතෙ කස්සප පාඩම අවසනට | පිරිත් පොතෙහි තුන් සූත්‍රය වන පොත් කිරීම, ඛන්ධ, මෝර පිරිත් ස‍ණ සජ්ඣායනය |
| 02 | සූරියො පාඩම අවසනට | බාලාවතාරයේ සඤ්ඤා කාණ්ඩය, ඇණවුම් පිරිත, අංගුලිමාල පිරිත් කඩපාඩම් දීම, මිත්තානිසංස, මහාකස්සපථෙර පිරිත වාචෝද්ගත කිරීම |
| 03 | සාබායො පාඩම අවසනට | බුද්ධානුස්සති,මෙත්තානුස්සති,වනපොත් කිරීම, ගිරිමානන්ද, ඉසිගිලි සූත්‍රය වාචෝද්ගත කිරීම, අනිත්ථිගන්ධකුමාරවත්ථු, ධම්මපදට්ඨකථා |
| 04 | කන්තාර තරණං පාඩම අවසනට | කතඤ්ඤූ සිගාලො පාලි පාඨාවලී ගාථා 20 අවසානයට, මහා වංශය 1,1,3,85,86,87 ගාථා, ධාතු මඤ්ජූසාව |
| 05 | බ්‍රහ්මාති මාතා පිතරො පාඩම අවසනට | අර්ථකථාචාරිය බුද්ධඝෝෂ මාහිමියන් දිඹුලාගල කාශ්‍යප මාහිමි, සංගාමජිසුත්තං, ගබ්බිනී සූත්‍රයේ අඩක්, උදානය හැඳින්වීම ගාථා 70 මහා ප්‍රජාපතී අපදාන හැඳින්වීම ඇතුළුව පෙළ පොතේ අටානාටිය සූත්‍රය 206 පිටුවේ අවසානයට |

**සැ.යු. නාම ක්‍රියා වරනැගිල්ල පාඩම් දීම කළ යුතුයි.**

**<u>සංස්කෘත</u>**

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 01 | ලබා දී ඇති වාර සටහන අනුව පළමු වාරයට අදාළ සියලු විෂය කොටස් සම්පූර්ණ කිරීම අනිවාර්ය වෙයි. මීට අමතර ව දෙවන වාරයට අදාළ කොටසෙන් අදාළ පෙළ පොත්වල (සෙසු නිර්දිෂ්ට පොත් නොවේ) පාඩම් දෙකක් දක්වා ද උගන්වා අවසන් කළ යුතු ය. | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුණරීක්ෂණය කරවන්න. |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

**<u>ගණිතය</u>**

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 01 | 1 පාඩමේ සිට 10 පාඩම තෙක් | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුණරීක්ෂණය කරවන්න. |
| 02 | 1 පාඩමේ සිට 10 පාඩම තෙක් | |
| 03 | 1 පාඩමේ සිට 12 පාඩම තෙක් | |
| 04 | 1 පාඩමේ සිට 10 පාඩම තෙක් | |
| 05 | 1 පාඩමේ සිට 08 පාඩම තෙක් | |

**<u>ඉංග්‍රීසි</u>**

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 01 | 04 ඒකකය අවසානය තෙක් | මෙහි දක්වා ඇත්තේ අවම මට්ටමින් ඉලක්ක සැපයීමක් වන අතර අභිමතය පරිදි උපරිම ප්‍රමාණයක ඉලක්ක කරා ලගා වීමට නිදහස ඇත. |
| 02 | 04 ඒකකය අවසානය තෙක් හා වැඩ පොත | |
| 03 | 04 ඒකකය අවසානය තෙක් හා වැඩ පොත | |
| 04 | 05 ඒකකය අවසානය තෙක් හා වැඩ පොත | |
| 05 | 06 ඒකකය අවසානය තෙක් හා වැඩ පොත | |

**<u>ඉතිහාසය</u>**

| ශ්‍රේණිය | පාඩම්/ නිපුණතා මට්ටම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 03 | 01 වන පාඩමේ සිට 03 වන පාඩමේ 3.1 නිපුණතා මට්ටම දක්වා | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුණරීක්ෂණය කරවන්න. |
| 04 | 01 වන පාඩමේ සිට 04 වන පාඩමේ 4.1 නිපුණතා මට්ටම දක්වා | |
| 05 | 01 වන පාඩමේ සිට 04 වන පාඩමේ 4.2 නිපුණතා මට්ටම දක්වා | |

## <u>සමාජ විද්‍යාව</u>

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 03 | 03 වන පාඩම අවසානය තෙක් | උගන්වා ඇති පාඩම් පුනරීක්ෂණය කරවන්න. |
| 04 | 03 වන පාඩම අවසානය තෙක් | |
| 05 | 03 වන පාඩම අවසානය තෙක් | |

## <u>භූගෝල විද්‍යාව</u>

| ශ්‍රේණිය | නිපුණතා ප්‍රමාණය හා විෂය අන්තර්ගතය | වෙනත් සටහන් |
|---|---|---|
| 03 | 3.4 නිපුණතාවට අදාළ පෘථිවි අභ්‍යන්තර ව්‍යූහය හා ගතික ස්වභාවය (පෘෂ්ඨය,ප්‍රාවරණය,හරය)<br>3.5 නිපුණතාවට අදාළ පෘථිවියේ සංයුතිය<br>3.6 නිපුණතාවයට අදාළ පෘථිවියේ විවිධ ස්ථානවල වේලාව දැක්වීමේ ක්‍රමවේද/ අක්ෂාංශ හා දේශාංශ/සම්මත වේලාව හා සම්මත වේලා කලාප වෙනස් වන වේලාව | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුණරීක්ෂණය කරවන්න. |
| 04 | 3.1 නිපුණතාවයට අදාළ ශ්‍රී ලංකාවේ දේශගුණයේ විශේෂත්වය/ දේශගුණයේ විවිධත්වය හා දේශගුණික තත්ත්වය<br>3.2 නිපුණතාවයට අදාළ ස්ථානීය/ප්‍රාදේශීය/ගෝලීය සාධක<br>3.3 නිපුණතාවයට අදාළ ශ්‍රී ලංකාවේ දේශ ගුණය කෙරෙහි බලපාන ප්‍රධාන අංග(උෂ්ණත්වය/වර්ෂාපතනය)/ ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තිය හා ස්වභාවය/රට තුළ පවතින ප්‍රශස්ත උෂ්ණත්වයේ වැදගත්කම/ උෂ්ණත්ව ව්‍යාප්තිය සිතියම් ගත කිරීම.<br>3.4 නිපුණතාවයට අදාළ ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම ඒවායේ ව්‍යාප්තිය හා ස්වභාවය හා මිනිසාට බලපාන ආකාරය(සංවහන වර්ෂාව/ මෝසම් වර්ෂාව/ වාසුළි හෙවත් අවපාත)<br>3.5 ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප නම් කරයි (තෙත් කලාපය/වියළි කලාපය/ අර්ධ ශුෂ්ක කලාපය) | |
| 05 | 4.1 නිපුණතාවයට අදාළ නිෂ්පාදන කර්මාන්ත/ යකඩ හා වානේ කර්මාන්ත/ඇඟලුම් කර්මාන්ත/මෝටර් රථ කර්මාන්තය/විද්‍යුත් කර්මාන්තය/ ලෝක ආකෘති සිතියම්වල නිෂ්පාදන කර්මාන්ත ලකුණු කර නම් කිරීම.<br>5.1 නිපුණතාවයට අදාළ ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු හැඳින්වීම/ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිභෝග වර්ග හා ගැටලු (යැපුම්/කෘෂිකර්මය/වී වගාව/ හේන්) / වාණිජ කෘෂි කර්මාන්තය(තේ/රබර්/පොල්/සුළු අපනයන භෝග | |

## <u>සාමාන්‍ය විද්‍යාව</u>

| ශ්‍රේණිය | නිපුණතා මට්ටම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 03 | 1.1 නිපුණතා මට්ටමේ සිට 3.5 නිපුණතා මට්ටම දක්වා | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුණරීක්ෂණය කරවන්න. |
| 04 | 1.1 නිපුණතා මට්ටමේ සිට 2.4 නිපුණතා මට්ටම දක්වා | |
| 05 | 1.1 නිපුණතා මට්ටමේ සිට 3.3 නිපුණතා මට්ටම දක්වා | |

**<u>සෞඛ්‍ය විද්‍යාව</u>**

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 03 | සෞඛ්‍ය හා නිරෝගීභාවය/ ආහාර ජීර්ණ පද්ධතිය සහ පෝෂණය/ රුධිර සංසරණ පද්ධතිය සහ නිරෝගී පැවැත්ම | මේ දක්වා උගන්වා ඇති පාඩම් පුණරීක්ෂණය කරවන්න. |
| 04 | සෞඛ්‍යවත් සමාජයක් ගොඩ නගමු/ සෞඛ්‍යවත් ජීවිතයක් සඳහා මානව අවශ්‍යතා සපුරා ගැනීම/ සෞඛ්‍යවත් ජීවිතයක් සඳහා සුදුසු ආහාර පරිභෝජනය කරමු | |
| 05 | සෞඛමත් සමාජයක් ගොඩ නැගීම/සෞඛ්‍යවත් ජීවිතයකට සුදුසු ආහාර/ මිනිසාගේ ශ්වසන පද්ධතිය/ මිනිසාගේ ස්නායු පද්ධතිය/ මිනිසාගේ රුධිර සංසරණ පද්ධතිය | |

**<u>දෙමළ</u>**

| ශ්‍රේණිය | පාඩම් ප්‍රමාණය | වෙනත් සටහන් |
|---|---|---|
| 01 | 01 වන පාඩම සිට 06 වන පාඩම තෙක් | මේ දක්වා ඇති සියලු ම පාඩම් පුනරීක්ෂණ කරවන්න |
| 02 | 01 වන පාඩම සිට 07 වන පාඩම තෙක් | |
| 03 | 01 වන පාඩම සිට 1.1.6 පාඩම තෙක් | |
| 04 | 01 වන පාඩම සිට 1.1.7 පාඩම තෙක් | |
| 05 | 01 වන පාඩම සිට1.1.6 පාඩම තෙක් | |

**සැ.යු.**

ඉහත විෂය වාරික ඉලක්ක විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ස්වාමීන් වහන්සේලා හා මහත්වරුන් ඒ ඒ විෂයයට අදාළ ගුරු උපදේශකවරුන් හා සම්පත් පුද්ගලයින් සහභාගි කරවා ගෙන සකස් කර ඇති අතර ගැටලු, යෝජනා හෝ අදහස් ඇත්නම් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් - සංවර්ධන 2) පූජ්‍ය බෝපිටියේ සිරි සුමේධ ස්වාමීන් වහන්සේගේ 0718097300 WhatsApp අංකයට යොමු කළ යුතු ය.